**පළාත් මාර්ග සංවර්ධන, ප්‍රවාහන, විදුලිබල හා බලශක්ති සහ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය**

## මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

# කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම

**මාර්ග ඉදිකිරීම් සඳහා වන මධ්‍යම පළාතේ ප්‍රමුඛතම ආයතනය සමඟ එක්වන්න අවස්ථාවක්**

**මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය සඳහා කොන්ත්‍රාත් පදනම මත පහත දැක්වෙන තනතුරු සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.**

## ඉංජිනේරු (සිවිල්) II ශ්‍රේණිය

**තනතුරු සංඛ්‍යාව** : **06 (කොන්ත්‍රාත් පදනම මත)**

- **වැටුප් පරිමාණය** : MM 1-1-2025 - රු. (91,690.00-10x2,480-15x3,450-168,240.00)
- **මාසික වැටුප** : කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2025 හි සඳහන් විධි විධාන අනුව වැටුප ගෙවනු ලැබේ.
- **සුදුසුකම්** : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් සිවිල් ඉංජිනේරු උපාධියක් ලබා තිබීම.

**සමඟ**

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ හා ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ ආශ්‍රිත සිවිල් ඉංජිනේරුවරයෙකු ලෙස ලියාපදිංචි වී තිබීම.

**සහ**

සුදුසුකම් ලබාගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර එක (01)ක පළපුරුද්දක් ලබාතිබීම.

## රසායනාගාර ඉංජිනේරු II ශ්‍රේණිය

**තනතුරු සංඛ්‍යාව** : **01 (කොන්ත්‍රාත් පදනම මත)**

- **වැටුප් පරිමාණය** : MM 1-1-2025 - රු. (91,690.00-10x2,480-15x3,450-168,240.00)
- **මාසික වැටුප** : කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2025 හි සඳහන් විධි විධාන අනුව වැටුප ගෙවනු ලැබේ.
- **සුදුසුකම්** : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් සිවිල් ඉංජිනේරු උපාධියක් ලබා තිබීම.

**සමඟ**

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ හා ශ්‍රී ලංකා ඉංජිනේරු සභාවේ ආශ්‍රිත ද්‍රව්‍ය/ සිවිල් ඉංජිනේරුවරයෙකු ලෙස ලියාපදිංචි වී තිබීම.

**සහ**

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර එක (01)ක පළපුරුද්දක් ලබා තිබීම.

## පරිපාලන නිලධාරි

**තනතුරු සංඛ්‍යාව** : **01 (කොන්ත්‍රාත් පදනම මත)**

- **වැටුප් පරිමාණය** : JM 1-1-2025 - රු. (72,650.00-10x1,360.00-18x2,040-122,970.00)
- **මාසික වැටුප** : කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2025 හි සඳහන් විධිවිධාන අනුව වැටුප ගෙවනු ලැබේ.
- **සුදුසුකම්** : මානව සම්පත් කළමනාකරණය/ රාජ්‍ය පරිපාලනය/ රාජ්‍ය කළමනාකරණය/ ව්‍යාපාර කළමනාකරණය/ ව්‍යාපාර පරිපාලනය/ වාණිජ්‍ය යන විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධිය ලබා තිබීම.

## කාර්මික නිලධාරි

**තනතුරු සංඛ්‍යාව** : **06 (කොන්ත්‍රාත් පදනම මත)**

- **වැටුප් පරිමාණය** : JM 1-1-2025 - රු. (72,650.00-10x1,360.00-18x2,040-122,970.00)
- **මාසික වැටුප** : කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2025 හි සඳහන් විධිවිධාන අනුව වැටුප ගෙවනු ලැබේ.
- **සුදුසුකම්**

**පහත 1 හෝ 2 හෝ 3**

1. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ 7) හත්වැනි (7) මට්ටමට නොඅඩු මට්ටමක තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.
2. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ 6) හයවැනි (6) මට්ටමට නොඅඩු මට්ටමක තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**සමඟ**

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක, පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 5 ක පළපුරුද්ද ලබා තිබීම.

3. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ 5) පස්වැනි (5) මට්ටමට නොඅඩු මට්ටමක තනතුරට අදාළ විෂය ක්ෂේත්‍ර යේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**සමඟ**

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍ර යේ අවම වශයෙන් වසර 10 ක පළපුරුද්ද ලබා තිබීම.

## කාර්මික සහකාර

**තනතුරු සංඛ්‍යාව - 23 (කොන්ත්‍රාත් පදනම මත)**

- **වැටුප් පරිමාණය** : MA 2-1-2025 - රු. (50,540.00-10x540-7x630-4 x890-20 x1,190-87,710.00)
- **මාසික වැටුප** : කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2025 හි සඳහන් විධි විධාන අනුව වැටුප ගෙවනු ලැබේ.
- **සුදුසුකම්** : තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ 5) පස්වැනි (5) මට්ටමට නොඅඩු මට්ටමක NCT (සිවිල් හෝ යාන්ත්‍රික) NCIT (සිවිල් හෝ යාන්ත්‍රික) ක්ෂේත්‍රයේ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

## වැඩ පාලක

**තනතුරු සංඛ්‍යාව - 72 (කොන්ත්‍රාත් පදනම මත)**

- **වැටුප් පරිමාණය** : PL 2-2025 - රු. (42,300.00-10x490-10x540-10x590-12x630-66,060.00)
- **මාසික වැටුප** : කළමනාකරණ සේවා චක්‍රලේඛ 1/2025 හි සඳහන් විධි විධාන අනුව වැටුප ගෙවනු ලැබේ.
- **සුදුසුකම්** : ඉදිකිරීම් සම්බන්ධයෙන් තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ 4) හතරවැනි (4) මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබාතිබීම.

**පොදු කොන්දේසි**

- ➢ අයදුම්කරුවන් බඳවා ගන්නා දිනට අදාළ සුදුසුකම් සියලු ආකාරයෙන් සම්පූර්ණ කර තිබිය යුතුය.
- ➢ බඳවා ගන්නා දිනට වයස අවුරුදු 45 ට වඩා අඩුවිය යුතුය. දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ, රජයේ අර්ධ රාජ්‍ය, පූර්ව රාජ්‍ය ආයතනයක (සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක) සේවයේ නියුක්ත අය සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බල නොපානු ඇත.
- ➢ සම්මුඛ පරීක්ෂණ වලදී අදාළ ක්ෂේත්‍රවල පළපුරුද්ද සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත.
- ➢ රාජ්‍ය සේවා අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත අදාළ දෙපාර්තමේන්තු/ සංස්ථා/ මණ්ඩල ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුය.
- ➢ අයදුම්කරුවන් විසින් තමාගේ ජීව දත්ත අඩංගු අයදුම්පත සකස්කර, අදාළ සහතික පත්‍රවල පිටපත් සමඟ යොමු කළ යුතු අතර, තමා පිළිබඳ තොරතුරු ලබා ගත හැකි දෙදෙනෙකුගේ නම් සඳහන් කළ යුතුය.
- ➢ මෙම තනතුර හුදෙක් කොන්ත්‍රාත් පදනම මත වන අතර, කොන්ත්‍රාත් කාලය අධිකාරියේ අභිමතය පරිදි දීර්ඝ කිරීම හෝ නොකිරීම සිදු කළ හැකිය.
- ➢ අයදුම්පත් යොමු කළ අය අතුරින් පුවත්පත් දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.
- ➢ තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම මධ්‍යම පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**බඳවා ගන්නා ක්‍රමය - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින්**

ඉහත සුදුසුකම් ඇතුලත් කර අයදුම්කරුවන් විසින් සකස් කර ගන්නා ලද ජීව දත්ත පත්‍රිකාව හා සපුරා ඇති සුදුසුකම්වල සහතික පත්‍ර සමඟ 2025.07.23 වැනි දින ට පෙර සාමාන්‍යාධිකාරී, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, අංක 09, ඇහැලේපොළ කුමාරිහාමි මාවත, බෝගම්බර, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ තනතුරු නාමය සඳහන් කළ යුතුය.

**සාමාන්‍යාධිකාරී, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය,**
**මධ්‍යම පළාත.**
**දුරකථන අංකය 081-2204378**

PLUSINFO.LK
PLUSINFO.LK